සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අනාවරණ පරීක්ෂණය 2021

7 ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

01. ලොව විශාලතම සාගරය ..................................................... සාගරයයි. (අත්ලාන්තික් / ඉන්දියන් / පැසිපික්)

02. අක්ෂාංශ හා දේශාංශ පදනම් කරගෙන රටක පිහිටීම දැක්වීම ........................................................ පිහිටීම ලෙස හඳුන්වයි. (නිරපේක්ෂ / සාපේක්ෂ / අනපේක්ෂ)

03. ශ්‍රී ලංකාවේ කොළඹ සිට ........................................................................ තුඩුව දක්වා පළල කිලෝමීටර් 224 කි.

    (දෙවුන්දර / පේදුරු / සංගමන්කන්ද)

04. යාපනය ප්‍රදේශයේ බහුලව දැකිය හැකි ආර්ථික වටිනාකමක් ඇති ශාකය වන්නේ .......................................... ගස ය. (පොල් / තල් / කිතුල්)

05. සුළි සුළං මගින් වැඩි බලපෑමක් එල්ල වන්නේ දිවයිනේ උතුරු හා ................................................................ ප්‍රදේශ වලටය. (දකුණු / නැගෙනහිර / වයඹ)

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

06. ඇන්ටාර්ක්ටිකා මහද්වීපය මිනිස් වාසයෙන් තොර වූ මහද්වීපයකි. (    )

07. ශ්‍රී ලංකාව අත්ලාන්තික් සාගරයේ ඉන්දියාවට ආසන්නව පිහිටා ඇත. (    )

08. කුඩා හෙල්වැටි අතරින් ගලාබසින ගංගා හරස්කර වැව් ඉදිකර තිබීම වියළි කලාපය භූ දර්ශනයේ ලක්ෂණයකි. (    )

09. සාමාන්‍ය දේශගුණික රටාවේ කෙටිකාලීන හා දිගුකාලීන වෙනස්වීම් දේශගුණ වෙනස්වීම් ලෙස හඳුන්වයි. (    )

10. සිතියමක් පිටලස් කිරීම සඳහා ට්‍රෙෂු කඩදාසි අවශ්‍ය නොවේ. (    )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11. දකුණු අක්ෂාංශ $23.5^0$ රේඛාව හඳුන්වන නම මින් කුමක් ද?

    (1) මකර නිවර්තනය (2) කර්කටක නිවර්තනය

    (3) ආක්ටික් වෘත්තය (4) ඇන්ටාර්ටික් වෘත්තය

12. පහත සඳහන් රටවල් අතරින් දකුණු ඇමරිකා මහද්වීපය තුළ පිහිටා ඇති රට කුමක් ද?

    (1) ආර්ජන්ටිනාව (2) කැනඩාව (3) චීනය (4) ප්‍රංශය

13. ස්පෘශ්‍ය උරුමයන්ට අයත් වන්නේ මින් කුමක් ද?

    (1) සිරිත් විරිත් (2) මඩු දේවස්ථානය

    (3) ආගන්තුක සත්කාරය (4) උඩරට නැටුම් කලාව

14. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාපයක් පිහිටා ඇති ප්‍රදේශයකි,

    (1) මහනුවර (2) රත්මලාන (3) බියගම (4) ගම්පහ

15. ශ්‍රී ලංකාවට බලනොපාන ස්වාභාවික උපද්‍රවය මින් කුමක් ද?

    (1) නියඟය (2) නායයාම් (3) ජලගැලීම් (4) ගිනිකඳු පිපිරීම්


- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට අදාළ පිළිතුර ඉදිරියෙන් ඇති පිළිතුරු අතරින් තෝරා ඊට හිමි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

| ''අ'' | | | ''ආ'' |
|---|---|---|---|
| 16. | උෂ්ණත්වය ඉහළ යාම නිසා ඇතිවන තත්වයකි. | (......................) | A කළු ගඟ |
| 17. | දේශගුණික වෙනස් වීම් ඇතිවීමට හේතුවකි. | (......................) | B දිශාව |
| 18. | තෙත් කලාපයේ පිහිටි ගංගාවකි | (......................) | C ජලහිගය |
| 19. | සිතියමක මූලික අංගයකි. | (......................) | D කලාඔය |
| 20. | වියළි කලාපයේ පිහිටි ගංගාවකි. | (......................) | E ගිනිකඳු |
| | | | F ජල ගැලීම් |

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

01 (අ) පහත දැක්වෙන සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(1) උතුරු ඇමරිකා මහාද්වීපය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(2) C අක්ෂරයෙන් දැක්වෙන රට කුමක් ද?

(3) D අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?

(4) අත්ලාන්තික් සාගරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(5) ආසියා මහාද්වීපය තුළ පිහිටි කැස්පියන් මුහුද දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(6) J අක්ෂරයෙන් දැක්වෙන ප්‍රධාන අක්ෂාංශ රේඛාව කුමක් ද?

(ලකුණු 06)

(ආ) පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) A අක්ෂරයෙන් දැක්වෙන නගරය කුමක් ද?


(2) B අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කය කුමක් ද?

(3) දෙවුන්දර තුඩුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(4) යාල වනෝද්‍යානය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(5) H අක්ෂරයෙන් දැක්වෙන දූපත කුමක් ද?

(6) බෙංගාල බොක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?





(ලකුණු 06)

(ඉ) ශ්‍රී ලංකාවේ සමාජයීය හා සංස්කෘතික අනන්‍යතාව පෙන්නුම් කෙරෙන පින්තූර කිහිපයක් A B C හා D වලින් දැක්වේ. ඒවා හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 04)

| A | B | C | D |
|---|---|---|---|
|  |  |  |  |
| ............................ | ............................ | ............................ | ............................ |

02 පෘථිවි ආදර්ශ ගෝලයේ රූප සටහනක් පහත දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




A ............................
B ............................
C ............................
D ............................
E ............................
F ............................

(i) ඉහත රූප සටහනේ A සිට F දක්වා ඇති ප්‍රධාන අක්ෂාංශ නම් කරන්න. (ලකුණු 06)

(ii) $0^0$ දේශාංශ රේඛා හඳුන්වන නම් කුමක් ද? (ලකුණු 01)


(iii) අක්ෂාංශ හා දේශාංශ යනු මොනවාදැයි කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04)

03 ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම, ඒවා ලැබෙන කාලසීමාව හා එහි විශේෂ ලක්ෂණ ඇතුළත් කර පහත වගුවේ හිස්තැන් පුරවන්න.

| වැසි ලැබෙන ක්‍රමය | ලැබෙන කාලසීමාව | විශේෂ ලක්ෂණ |
|---|---|---|
| 1 ............................ | ★ මාර්තු<br>★ අප්‍රේල්<br>2 ..................<br>★ ඔක්තෝම්බර් | ★ අසනි වැසි, සවස්කල වැසි ලෙ ද හඳුන්වයි<br>3 ............................ |
| නිරිතදිග මෝසම් | 4 ..................<br>★ ජූනි<br>★ ජූලි | 5 ............................ |
| 6 ............................ | ★ ඔක්තෝම්බර්<br>7 ..................<br>★ දෙසැම්බර් | 8 ............................<br>★ බෙංගාල බොක්ක ප්‍රදේශයේ හටගන්නා වායු කැලඹීම් නිසා ඇතිවේ. |
| ඊසානදිග මෝසම් | 9 ..................<br>10 ..................<br>★ ජනවාරි | 11 ............................ |

04 ශ්‍රී ලංකාවේ කඳුකර භූ දර්ශනයේ සිතියමක් පහතින් දක්වා තිබේ.

(i) B හා C අක්ෂර වලින් දැක්වෙන කඳු වැටි දෙක නම් කරන්න. (ලකුණු 02)




(ii) මෙම සිතියමේ,

a) මහනුවර සානුව දැක්වෙන අක්ෂර කුමක් ද

b) බඹරකන්ද දිය ඇල්ල දැක්වෙන අක්ෂරය කුමක් ද?

c) බලන දුර්ගය දැක්වෙන අක්ෂරය කුමක් ද?

d) G හා H වලින් දැක්වෙන ගංගා දෙක නම් කරන්න.

G H (ලකුණු 05)

(iii) මෙම සිතියමින් දක්වා ඇති ප්‍රදේශයේ සිදු කෙරෙන පහත ආර්ථික ක්‍රියාකාරකම් හඳුනාගෙන නම් කරන්න.



1 .................................... 2.................................... 3.................................... 4 ....................................

(ලකුණු 04)

05 යාපනය අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භූ දර්ශනයේ සිතියමක් පහත දක්වේ.

(i) එහි A සිට D දක්වා ඇති ස්ථාන මොනවාදැයි වරහන් තුළින් තෝරා ලියන්න.


(කයිට්ස් / යාපනය / පලාලි /ඩෙල්ෆ්ට් / අලිමංකඩ) (ලකුණු 04)

A ..................................................................

B ..................................................................

C ..................................................................

D ..................................................................




(ii) යාපනය අර්ධද්වීපයේ හා දූපත් ආශ්‍රිත පිහිටි ඓතිහාසික හා සාමාජයීය වැදගත්කමක් ඇති ස්ථාන කිහිපයක ඡායා රූප පහත දක්වේ. ඒවා හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 04)



1.................................... 2.................................... 3 .................................... 4....................................

(iii) යාපනය ප්‍රදේශයේ භෞතික භූ දර්ශනයේ කැපීපෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

1. .................................... 2. .................................... 3. ....................................

(ලකුණු 03)

06 (i) ස්වාභාවික ආපදා ඇතිවීමට බලපාන හේතු කිහිපයක් පහත දැක්වේ. ඒවා අතරින් ගංවතුර හා නායයාම් ඇති වීමට බලපාන හේතු තෝරා වගුව තුළ ලියන්න. (ලකුණු 04)

- ★ පහත්බිම් ගොඩ කිරීම
- ★ අධික බෑවුම් සහිත බව
- ★ ජලය හිඟ වීම.
- ★ උස්බිම්වල ජලය රඳවා තැබීම.
- ★ ජල මාර්ග අවහිරි වීම.
- ★ ගෝලීය උණුසුම වැඩිවීම.

| ගංවතුර ඇතිවීමට හේතු | නායයාම් ඇතිවීමට හේතු |
|---|---|
| 01 ........................................ | 01 ........................................ |
| 02 ........................................ | 02 ........................................ |

(ii) ආපදා කළමනාකරණ චක්‍රයට අනුව කටයුතු කළයුතු ආකාර කිහිපයක් පහත් දැක්වේ. ඒවා එක් එක් අවස්ථාව යටතේ වර්ග කර වගුව තුළ ලියන්න. (ලකුණු 07)

- ★ වන වැස්ම ආරක්ෂා කිරීම
- ★ ආපදාවට පත්වූවන්ට සහන සැලසීම
- ★ ජීවිත රැක ගැනීම
- ★ ඔරොත්තු දෙන ලෙස නිවාස ඉදිකිරීම
- ★ සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ★ පිසූ ආහාර ලබා දීම
- ★ ජනතාව දැනවත් කිරීම

| පෙර සූදානම | ආපදා අවස්ථාව | ආපදාවෙන් පසු අවස්ථාව |
|---|---|---|
| 1. ............................ | 4. ............................ | 6. ............................ |
| 2. ............................ | ............................ | ............................ |
| 3. ............................ | 5. ............................ | 7. ............................ |
| ............................ | ............................ | ............................ |

07 දී ඇති උපකාරක පද ඇසුරින් පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

හරහට

(1) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගාවකි.


(2) කඳුකර ප්‍රදේශයේ භූ ලක්ෂණයකි.

(5) ස්වාභාවික උපද්‍රවයකි.

(7) වෙරළ ආශ්‍රිත ප්‍රධාන කර්මාන්තයකි.

(8) කාර්මික ජනපදයකි.

(10) නිතර ගංවතුර ආපදාවට ලක්වන දිස්ත්‍රික්කයකි.




පහළට

(1) වියළි කලාපයේ පිහිටි දිස්ත්‍රික්කයකි.

(3) රට මැද පිහිටි ප්‍රධාන කඳු වැටියකි.

(4) මානව නිර්මිත උරුමයක් වන ''ප්‍රාසාදය'' යන්නට සමාන පදයකි.

(6) ප්‍රධාන කපොල්ලකි.

(9) වෙරළබඩ තැනිතලාවේ භූ ලක්ෂණයකි.

## පිළිතුරු පත්‍රය - I කොටස

01. පැසිපික් 02. නිරපේක්ෂ 03. සංගමන්කන්ද 04. තල් 05. නැගෙනහිර 06. ✓
07. ✗ 08. ✓ 09. ✓ 10. ✗ 11. මකර නිවර්තනය 12. ආර්ජන්ටිනාව
13. මඩු දේවස්ථානය 14. බියගම 15. ගිනිකඳු පිපිරීම. 16. C 17. E 18. A
19. B 20. D

(2 x 20 = ල. 40)

## II කොටස

01 (අ) (1) A (2) චීනය (3) මැඩගස්කරය (4) F (5) G (6) මකර නිවර්තනය (ල. 06)

(ආ) (1) කෙළඹ (2) කුරුණෑගල (3) D (4) G (5) මන්නාරම (6) J (ල. 06)

(ඉ) (1) වැදිජනතාව (2) දළදා පෙරහැර (3) සීගිරිය (4) කෝවිලක් (ල. 04)

02 (i) A - උත්තර ධ්‍රැවය B - ආර්ටික් වෘත්තය C - කර්කටක නිවර්තනය D - සමකය E - මකර නිවර්තන F - ඇන්ටාර්ටික් වෘත්තය (ල. 06)

(ii) ග්‍රිනිච් රේඛාව (ල. 01)

(iii) අක්ෂාංශ - පෘථිවි ආදර්ශ ගෝලයේ නැගෙනහිර සිට බටහිරට තිරස්ව ඇඳ ඇති මනඃකල්පිත රේඛා
දේශාංශ - උතුරේ සිට දකුණට සිරස් අතට ඇඳ ඇති මනඃකල්පිත රේඛා (ල. 04)

03 (1) සංවහන (2) සැප්තැම්බර්
(3) ගිගුරුම් සහිත වර්ෂාවකි / වර්ෂය මුළුල්ලේම ක්‍රියාත්මක වේ. (4) මැයි
(5) බටහිර හා නිරතදිග ප්‍රදේශවලට අධික වැසි ලැබේ / තෙත් කලාපයට අධික වැසි ලැබේ.
(6) වාසුළි (7) නොවැම්බර් (8) සුළං සහිත තද වර්ෂාවකි (9) නොවැම්බර්
(10) දෙසැම්බර් (11) උතුරු, නැගෙනහිර හා ඊසාන ප්‍රදේශවලට අධික වැසි ලැබේ. (ල. 11)

04 (i) B - නකල්ස් C - සමනල (ල. 02)
(ii) (a) A (b) D (c) E (d) G - කැළණි ගඟ H - මහවැලි ගඟ (ල. 05)
(iii) (1) තේ වගාව (2) මල්වගාව (3) එළවළු වගාව (4) සත්ව පාලනය (ල. 04)

05 (i) A - යාපනය B - අලිමංකඩ C - කයිට්ස් D - ඩෙල්ෆ්ට් (ල. 04)
(ii) (1) යාපනය පුස්තකාලය (2) නාගදීපය (3) නල්ලූර් කෝවිල (4) යාපනය කොටුව (ල. 04)
(iii) තැනිතලා බිම් / කලපු / දූපත් / වැලිතලා / සාරවත් රතුපස / හුණුගල් පස / භූගත ජලය (ල. 03)

06 (i) ගංවතුර - පහත්බිම් ගොඩකිරීම / ජල මාර්ග අවහිර කිරීම
නායයාම් - අධික බෑවුම් සහිත බව / උස්බිම්වල ජලය රඳවා තැබීම. (ල. 04)
(ii) (1) වනවැස්ම ආරක්ෂා කිරීම. (2) ජනතාව දැනුවත් කිරීම.
(3) ඔරොත්තුදෙන ලෙස නිවාස ඉදි කිරීම. (4) ජීවිත රැක ගැනීම.
(5) පිසූ ආහාර ලබා දීම. (6) සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
(7) ආපදාවට පත්වූවන්ට සහන සැලසීම. (ල. 07)

07 හරහට - (1) වලවේ (2) නිම්න (5) නියගය (7) ලුණු (8) ඒකල
(10 රත්නපුර
පහළට - (1) වව්නියාව (3) නමුණුකුල (4) පාය (6) ගලගෙදර (9) කලපුව (ල. 11)